**දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - 03 කොටස - 2020**

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - 03 කොටසේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - 03 කොටසේ, මුළු දිග වැටිය සිට අන්දරවැව දක්වා කි.මී 15 ක් පමණ වේ. හම්බන්තොට ජාත්‍යන්තර අගනගර සංවර්ධන කටයුතු සඳහා ආධාර කිරීම හා පහසුකම් සැලසීම වෙනුවෙන් මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ එක් ප්‍රධාන අරමුණක් ලෙස හඳුනා ගැනුණි. යෝජිත දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව මාතර සිට බෙලිඅත්ත (01 කොටස), බෙලිඅත්ත සිට වැටිය (02 කොටස), වැටිය සිට අන්දරවැව (03 කොටස) සහ මත්තල සිට අන්දරවැව හරහා හම්බන්තොට දක්වා (04 කොටස) ලෙස කොටස් හතරකට බෙදා තිබුණි. ණය ගිවිසුම් වලට අනුව, 03 කොටසේ ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලියන 36,174 ක් වූ අතර සිවිල් වැඩ සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 252 කට සමාන රු. මිලියන 31,574 ක් චීනයේ අපනයන ආනයන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2016 ජනවාරි 25 දින ආරම්භ කර තිබුණු අතර 2018 ජනවාරි 25 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය 2019 ජුනි 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ඊට සම්බන්ධ පාර්ශවයන් දැනුවත් කරන ලදී.

# 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ට අනුව 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේදී ගෙවීමට අවශ්‍ය ප්‍රමාද පොලී සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා වන්දි ගෙවීම ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය විසින් සිදු කරන ලද අතර දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - 03 කොටසේ ව්‍යාපෘති කාර්යාලයට ඉඩම් අත්පත් කර ගැනීම සඳහා කිසිදු මූල්‍ය අධිකාරියක් පවරා නොතිබුණි. ඒ නිසා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 අනුව ප්‍රතිපාදන සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණද, කෙරීගෙන යන වැඩ ශේෂය වූ රු. මිලියන 40,994 ක් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් නිම කරන ලද වැඩවලට මාරු කර නොතිබුණි. | කෙරීගෙන යන වැඩ ශේෂය නිම කරන ලද වැඩවලට මාරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ට අනුකූලව වත්කම් හඳුනාගත යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල 2.4 සටහනේ ව්‍යාපෘතිය අවසන් කර ඇති බව සහ සියලු හිඟ ශේෂයන් පියවා ඇති බව සඳහන් කර තිබුණද, 2020 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 14.51 ක මුදලක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි නොපියවූ ශේෂයක් ලෙස පෙන්වා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | සියලු වගකීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කළ යුතුය. |
| (ඈ) | 2020 දෙසැම්බර් 31 දිනට චීන යුවාන් 27,586,539 ක ඉතිරි ණය ශේෂය සඳහා බැඳීම් ගාස්තු (commitment charges) සඳහා ප්‍රතිපාදන සපයා නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 අනුව ප්‍රතිපාදන සැළසිය යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව මෙහෙයුම් සහ ආයෝජන කටයුතුවලට අදාළ මුදල් ගලා ඒම් සහ ගලායාම් හඳුනාගෙන නොතිබුණි. | එකඟවෙමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | අදාළ කොන්ත්‍රාත්කරුගේ පිරිවැයෙන් කාර්ය සාධන ඇපකරයක් ලබා ගතයුතු බවට වන කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි 4.2 උප වගන්තිය යටතේ ඇති විධිවිධානවලට පටහැනිව, | කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුව කාර්ය සාධන ඇපකරය ඔහුගේම වියදමින් ලබා දිය යුතු බව යන්නෙන් අදහස් වන්නේ කාර්ය සාධන ඇපකරය ඉදිරිපත් කිරීම පාර්ශව අතර | ලංසු ලේඛන නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත්කරුවන්ට කාර්ය සාධන ඇපකර සැපයීමේ පිරිවැය සඳහන් කිරීමට ඉඩ දෙමින් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතම සකස් කර තිබුණි. ඒ අනුව කාර්ය සාධන ඇපකරවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා රු. මිලියන 99.37 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට අතිරේකව ගෙවා තිබුණි. | ගිවිසුමකට එළඹීමට පූර්ව අවශ්‍යතාවයක් වන අතර ඉන් පසුව කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත් ප්‍රමාණ පත්‍රවල එකවර ගෙවීම් (LS) අයිතම යටතේ කාර්ය සාධන ඇපකරයේ පිරිවැය ඉල්ලා සිටීමට අයිතියක් ඇති බවයි. | |
| (ආ) | ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනයන්ට අනුව අධිවේගී මාර්ගයේ වැටිය සිට අන්දරවැව දක්වා සේවා ප්‍රදේශ ඉදිකිරීමට හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, අධිවේගී මාර්ගය භාවිත කරන්නන් සඳහා පහසුකම් සැලසීම සඳහා සේවා ප්‍රදේශය සැලසුම් කිරීමට හෝ අධිවේගී මාර්ග ප්‍රමාණ පත්‍ර කෙටුම්පතේ ප්‍රතිපාදන වෙන් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘති කොන්ත්‍රාත් ප්‍රමාණ පත්‍ර කිසිවක සංකල්පීය අවධියේදී (Conceptual stage) සිවිල් වැඩ කොන්ත්‍රාත්තු හරහා සේවා ප්‍රදේශය ඉදිකිරීමට ප්‍රතිපාදන සපයා නැත. | සේවා ප්‍රදේශයකට පහසුකම් සැලසීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයේ වැටුප් සඳහා පොදු කාර්ය වියදම් ලෙස රු. මිලියන 3.5 ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | ව්‍යාපෘතිවලින් අමතර පොදු කාර්ය පිරිවැය දැරීම නැවැත්වීමට කටයුතු කළ යුතුය. |

**3.2 ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදය**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේදී ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර සති 26 ක් තුළ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු කඩිනම් කර අවසන් කිරීමට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ, තක්සේරු දෙපාර්තමේන්තුවේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්ට රු. මිලියන 13.5 ක දිරි දීමනා ගෙවා තිබුණද, ඉඩම් | ඉඩම් අත්පත් කර ගැනීමේ පිරිවැය ගෙවීමට බැංකු ණය ලබා ගැනීම, වන්දි ගෙවීම, එක් එක් දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘති කොටස්වල ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අරමුදල් වෙන් කිරීම සහ ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධ සියලු කටයුතු ක්‍රියාත්මක කිරීම SPD කාර්යාලයෙන් සිදු කරන ලදී. ඒ අනුව, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘති 03 කොටසේ ව්‍යාපෘති කාර්යාලයට කිසිදු මූල්‍ය අධිකාරියක් පවරා | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තවමත් සිදු වෙමින් පැවතිණි. | නොතිබුණි. | |
| (ආ) | ලැබී ඇති තොරතුරුවලට අනුව ව්‍යාපෘතිය විසින් ඉඩම් කට්ටි 3,029 ක් අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වී තිබුණි. එයින් ඉඩම් කට්ටි 2,182 ක් සඳහා රු. මිලියන 1,108.61 ක් වන්දි වශයෙන් ගෙවා තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් කට්ටි 769 ක් සඳහා පමණක් රු. මිලියන 74.2 ක් ප්‍රමාද පොලී ලෙස ගෙවා තිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 උප වගන්තියට අනුව මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ කිසිසු ඉඩම් කට්ටියක් ලියාපදිංචි කිරීමට ව්‍යාපෘතිය අපොහොසත් වී තිබුණි. | -එම- | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |